Global Buddhist
Climate Change Collective

2015 ඔක්තෝබර් මස 29 වන දින

# ලෝකනායකයින් සඳහා දේශගුණික විපර්යාස පිලිබඳ බෞද්ධ ප්‍රකාශය

පහත නම් සඳහන් බෞද්ධ නායකයින් වන අපි, ප්‍රංශයේදී පැවැත්වීමට නියමිත දේශගුණික විපර්යාසයන් පිලිබඳ වූ එක්සත් ජාතීන්ගේ සමුළුවේ (UNFCCC), විවිධ කණ්ඩායම් වලින් සමන්විත සම්මන්ත්‍රණයේ 21වන සැසියට (COP 21), ප්‍රථම මෙසේ එක්වන්නේ දේශගුණික විපර්යාසයන් පිලිබඳ ලෝක නායකයන් සැමහට මෛත්‍රීයෙන් හා කරුණාවෙන් සපිරුණු හදවතෙන් හා බුද්ධියෙන් සිතා බලා, බලාපොරොත්තු තබාගත හැකි ක්‍රියාකාරී ක්‍රමවේදයන් සඳහා පොදු එකඟතාවයකට ආරාධනා කිරීමටයි.

වර්තමානයේදී අපි සැම අත්දකින ආකාරයට, අපගේම විවිධ ක්‍රියාකාරකම් නිසාවෙන් අපගේ හා අන් ජීවීන්ගේ පැවැත්ම පිලිබඳ ඉතා තීරණාත්මක අවධියක් පසු කරමින් සිටින්නෙමු. තවමත්, දේශගුණික විපර්යාසයන් හා ඒවායේ බලපෑම් අවම කිරීමට අපට ඉඩකඩ ඇත. එසේ කිරීමට නම්, පොසිල ඉන්ධන භාවිතයෙන් ඉවත් වීමත් , අන්තරායට ලක් වූ විවිධ සත්ව විශේෂ වල ආරක්ෂාව සඳහා දිගුකාලින හා ප්‍රායෝගික ක්‍රියාමාර්ග ගැනීමත්, පිලිබඳ විස්තරාත්මක හා අනුවර්තන මිනුම් ඇතුලත් වූ ක්‍රමවේදයක් ප්‍රංශයේ COP 21 සමුළුවෙන් අපට ඉදිරිපත් කළ යුතුව ඇත.

බෞද්ධ ඉගැන්වීම් වල සඳහන් පරිදි , නැවත නැවතත් දේවල් හට ගැනීම හා විශ්වයේ පවතින සැම සියලු දෙයක්ම එකිනෙක හා බැඳී ඇති බව මත අපගේ විශ්වාසය ගොඩනැගී ඇත. මෙම අන්තර්-බැදියාව හා අපගේ ක්‍රියාකාරකම් වල ඇති බලපෑම් පිළිබඳ තේරුම් ගැනීම, පාරසරික බලපෑම් අවම කිරීමෙහිලා විශේෂ ස්ථානයක් ගනී. මෙම හැඟීම් දියුණු කිරීම මගින්, බිය නොවී , ආදරය කිරීම තුළින් අපගේ මිහිතලය රැක ගැනීමටත් හැකියාව ලැබෙනු ඇත. මේ පිළිබඳව බෞද්ධ නායකයින් දශක ගණනාවක් තිස්සේ ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද, අප හුස්ම ගන්නා වාතය, අප පරිභෝජනය කරන ආහාර හා ජලය මත අප පරිසරය හා අපගේ ජීවන රටාව කොතරම් දුරට එක්වී ඇත්ද යන්න එදිනෙදා ජීවිතයේදී අපට අමතකව යයි. නිසි අවබෝධයක් නොමැතිකමින් , අපගේ හා අන් ජීවීන්ගේ පැවැත්මට ඉවහල්වන ජීව ආධාරක පද්ධතීන් දිනෙන් දින විනාශ කරමින් සිටිමු.

අප විස්වාස කරන පරිදි, ලෝක බෞද්ධ ප්‍රජාව විශේෂයෙන්ම පිළිගන්නා පරිදි අපගේ පැවැත්ම රඳා පවතින්නේ අප එකිනෙකා මත සහ ස්වභාවික පරිසරය මතයි. මුළු මනුෂ්‍ය වර්ගයාම එකට එක්වී පරිසරය විනාශ කරන මූලික කරුණු වන, පොසිල ඉන්ධන දහනය, තිරසාර නොවන පාරිභෝගික රටාවන්, දැනුම සහ අවබෝධය නොමැතිකම, මෙන්ම මේ විනාශයන් පිළිබඳ හැඟීමක් නොමැතිකම ආදී කරුණු සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය.

බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඇතුළු බෞද්ධ නායකයන් විසින් අත්සන් කරන ලද දේශගුණික විපර්යාසන් පිලිබඳ බෞද්ධ ප්‍රකාශය වන ''ක්‍රියාත්මක වීමට කාලයයි මේ '' ප්‍රකාශය සඳහා අපි උපරිම සහයෝගය දෙන්නෙමු. අනෙකුත් ආගම් වලින්ද මේ පිලිබඳ කළ ප්‍රකාශයන් අගය කරන අතර තව දුරටත් එසේ කිරීමට අපි ආරාධනය කරන්නෙමු. මෙම වසරේ මුල් කාලයේදී ප්‍රකාශ වුනු , ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ප්‍රකාශය වන ''අප සැමගේ නිවහනට දයාව දැක්වීම'' දේශගුණික විපර්යාසන් පිලිබඳ ඉස්ලාම් ප්‍රකාශය මෙන්ම ඉදිරියේදී ප්‍රකාශ වීමට නියමිත දේශගුණික විපර්යාසන් පිලිබඳ හින්දු ප්‍රකාශය මෙසේ ඉදිරිපත් වූ ප්‍රකාශයි. අප මෙසේ එක්ව සිටින්නේ පොසිල ඉන්ධන භාවිතයෙන් වැළකීම, අපගේ පරිභෝජන රටාවන් වෙනස් කිරීම, විශේෂයෙන්ම ලෝකයේ දුප්පතුන් උදෙසා වූ දේශගුණික විපර්යාසන් පිලිබඳ හේතු හා ඒවායේ බලපෑම් පිලිබඳ වූ ආචාරධර්ම පද්ධතියක් ඇතිකිරීම යන කරුණු මුල් කරගෙනයි.

Global Buddhist
Climate Change Collective

මේ සඳහා, අප ලෝක නායකයින් උනන්දු කරන්නේ, දේශපාලනමය වශයෙන් අවශ්‍ය වන්නාවූ නායකත්වය මගින්, ගෝලීය උණුසුම ඉහළයාම සෙල්සියස් අංශක 1.5 මට්ටමට අඩු මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමටයි. එමෙන්ම, දේශගුණික විපර්යාසයන් වල බලපෑමට මුහුණ දීම සඳහා පෙර සූදානමක් ලෙස දේශගුණික මූල්‍යය ඉහල නැංවීමටත් සහ එමගින් අවම කාබන් මට්ටමක් සහිත අනාගතයක් කරා ආරක්ෂාකාරී පරිවර්තනයක්, සංවර්ධනය වෙමින් පවතින රටවල් හට උරුමකර දීම අපේක්ෂා කෙරේ.

මෙහි ඇති සුභදායක කරුණක් වන්නේ, ප්‍රංශයේ දේශගුණික විපර්යාසයන් පිලිබඳ සමුළුවේදී, ඒ පිලිබඳ විශේෂ වූ හැරවුම් ලක්ෂ්‍යකට අපට පිවිසීමට හැකියාව ලැබීමයි. විද්‍යාඥයින් විශ්වාස කරන පරිදි, සාමාන්‍ය ලෝක උණුසුම ඉහළයාම සෙල්සියස් අංශක 1.5කින් අවම කිරීම තාක්ෂණිකව හා ආර්ථිකමය වශයෙන් කළ හැකි කාර්යයකි. පොසිල ඉන්ධන භාවිතය සම්පූර්ණයෙන් නතර කර, පුනර්ජනනීය බලශක්තීන් භාවිත කිරීම ගෝලීයමය වශයෙන් යොමුකිරීම පමණක් නොව, අඩු-කාබනික නිෂ්පාදන කෙරෙහි යොමු වීම මගින්, අපට වඩාත් වැදගත් වන්නා වූ අධ්‍යාත්මික නැවුම් බවක් සඳහා වූ මග පෙන්වීමද සිදුවනු ඇත. අප අධ්‍යාත්මික වශයෙන් ඉදිරියට යාමට අමතරව, එක්සත් ජාතීන්ගේ නිර්දේශ වලට අනුකූලව, තනි තනි වශයෙන් අපට ගත හැකි වඩාත් ඵලදායි ක්‍රියාමාර්ග වන, වනාන්තර සුරැකීම, ශාකමය ආහාර වේලක් සඳහා යොමුවීම (නිර්මාංශ වීම), පරිභෝජනය අවම කිරීම, ප්‍රතිචක්‍රීකරණය, පුනර්ජනනීය බලශක්තීන් සඳහා යොමුවීම, ගුවන් ගමන් අවම කිරීම හා පොදු ගමනාගමන කටයුතු භාවිතය ආදි ක්‍රියාමාර්ග ඔහින් අප සැම හට සැබෑ වෙනසක් කළ හැක.

වර්තමානයේ, මෙන්ම අනාගතයේදීද ජීවත්වීමට ඇති අයිතිය සහතික කර, සැම දෙනාටම මේ සම්බන්ධයෙන් ඇති වගකීම හඳුනා ගැනීමටත්, ඒ පිලිබඳ හඬ අවදි කරන්නටත් විවිධ මට්ටමේ ලෝක නායකයින්ට අප ඇරයුම් කරමු.

මේ අනුව පැරිසියේදී එක් වන්නා වූ සියළු පාර්ශවයන් සඳහා පහත කරුණු සැලකිල්ලට ගැනීමට ආරාධනය කරන්නෙමු.

1. දේශගුණික විපර්යාස පිලිබඳ වූ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයේ (UNFCCC) 3 වන පරිච්ඡේදයේ සඳහන් පරිදි, දේශගුණික විපර්යාසයන් වෙනස්වීම් පිලිබඳ වූ සදාචාරාත්මක වෙනසකට යොමු වීමත්,

2. පොසිල ඉන්ධන භාවිතය නතරකර, සම්පූර්ණයෙන්ම පුනර්ජනනීය බලශක්තීන් වෙත යොමුවීමත්,

3. දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම් අවම කිරීමේ කටයුතු වලදී ගෝලීය උණුසුම ඉහල යාම සෙල්සියස් අංශක 1.5 මට්ටමට අවමව තබා ගැනීමට (කාර්මීකරණයට පෙර කාලවකවානු මෙන්), දේශපාලනමය වශයෙන් වූ සහයෝගය ලබා දීමත්,

4. 2009 වර්ෂයේ කෝපන්හේගන් සමුළුවේ එකගවූ පරිදි, සංවර්ධනය වෙමින් පවතින රටවල් හට දේශගුණික විපර්යාස වල බලපෑම් අවමකිරීම උදෙසා සහ අවම කාබන් ආර්ථිකයක් වෙත යොමුවීම සඳහා, හරිත දේශගුණික අරමුදලද (GCF) ඇතුළුව, මූල්‍යමය වශයෙන් ඩොලර් බිලියන 100 ක මට්ටමකින් පොදු දායකත්වය ඉහල නැංවීම.

මේ ක්‍රියාත්මක වීමට කාලයයි!

මෙයට විශ්වාසී,

Global Buddhist
Climate Change Collective

**His Holiness the Dalai Lama Tenzing Gyatso,** 14th Dalai Lama

**Zen Master Thich Nhat Hanh,** Patriarch of the Plum Village International Community of Engaged Buddhists

**His Holiness the 17th Gyalwang Karmapa,** Head of the Karma Kagyu

**His Holiness Dr. Dharmasen Mahathero,** The Supreme Patriarch (Sangharaja) of the Bangladesh Sangha

**Rev. Hakuga Murayama,** President, All Japan Young Buddhist Association (JYBA)

**His Eminence Jaseung Sunim,** President, Jogye Order of Korean Buddhism

**Bhante B. Sri Saranankara Nayaka Maha Thera,** Chief Adhikarana Sangha Nayaka of Malaysia , Kuala Lumpur, Malaysia

**His Eminence Rev. Khamba Lama Gabju Demberel,** The Supreme Head of Mongolian Buddhists

**His Holiness Dr. Bhaddanta Kumarabhivamsa,** Sangharaja, and Chairman State Sangha Maha Nāyaka Committee, Myanmar

**His Eminence Agga Maha Panditha Dawuldena Gnanissara Maha Nayaka Thera,** Mahanayaka Thero, The Supreme Prelate of the Amarapura Maha Nikaya, Sri Lanka

**His Holiness Thich Pho Tue,** Supreme Patriarch of All Vietnam Buddhist Sangha

**Venerable Lama Lobzang**, Secretary General of the International Buddhist Confederation (IBC)

**Venerable Olivier Reigen Wang-gen,** President, Buddhist Union of France (UBF)

**Venerable Bhikku Bodhi,** President, Buddhist Association of the USA

**Royal Highness Ashi Kesang Wangmo Wangchuk,** Bhutan